**ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**------------------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------------**

**කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 19 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 04 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.**

**මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ මෙම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**----------------------------------------------------**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකිම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
**---------------------------------------------------------------------------------------------------------**

**පොදුවේ පිළිගත් ගිණුම්කරන මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී,

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන් දීමේ නිලධාරි සහ ගණන් දීමේ නිලධාරි දැනුවත් කරන ලදී .

**1.5** වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් සිදු කළ නිර්දේශ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ක්‍රියාත්මක කර තිබුණු බව,

**1.6** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

**1.6.1** මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ACA – 6) අනුව 2019 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත උපකරණ මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු8,149,483,260 ක් වූ අතර භාණ්ඩාගාර වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව එම වටිනාකම රු.8,407,376,732 ක් වූයෙන් ශේෂයන් අතර රු.257,893,472 ක වෙනස්කම් පැවතිනි. 2019 ඔක්තෝබර් 15 දිනැති අංක 269/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.8 ඡේදයේ විධිවිධාන පරිදි ඉහත ශේෂයන්ගේ වෙනස්කම් සහ විෂමතාවයන් සැසඳුම් කර නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි. | 2019 ඔක්තෝබර් 15 දිනැති අංක 269/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.8 ඡේදයේ විධිවිධාන පරිදි ශේෂයන්ගේ වෙනස්කම් සැසඳුම් කර නිවැරදි කිරීමට පියවර ගත යුතු වීම. | මෙම වෙනස්කම් හඳුනාගෙන ඇති අතර, 2019 භාණ්ඩාගාර ගිණුම් වාර්තාව නිවැරදි කර ගැනීමට කාලය ප්‍රමාණවත් නොවූ නිසා මෙලෙස වෙනස්කම් තිබෙන බවත්, මේ වනවිට එම වෙනස්කම් නිවැරදි කර ඇත. |
| (ආ) | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ACA-6) 2018 දෙසැම්බර් 31 දිනට රු.6,392,122,276 ක්වූ මූල්‍ය නොවන වත්කම් එකතුව වටිනාකම, 2019 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය ලෙස | පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණු මූල්‍ය නොවන වත්කම් වටිනාකම | දේපළ, පිරියත හා උපකරණවල ශේෂයට අදාළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශේෂය සහ භාණ්ඩාගාර ගිණුම් වාර්තාවේ ශේෂය අතර වෙනසක් පැවතීම රජයේ ගිණුම් සකස් කරනු ලබන |

| | | | |
|---|---|---|---|
| | ඉදිරියට ගෙන එනු වෙනුවට, එම දිනට සටහන් කර තිබුණු ආරම්භක ශේෂය රු.7,662,169,394 ක් විය. මේ අනුව අවසන් ශේෂය, ආරම්භක ශේෂය වශයෙන් ඉදිරියට ගෙන යාම සටහන් කිරීමේ දී රු.1,270,047,118 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු බව නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයේ ගිණුම්වලින් අත්හැරී තිබුණු මූල්‍ය නොවන වත්කම් වටිනාකම 2019 වර්ෂයේ ආරම්භක ශේෂයට එකතු කර දැක්වීම තුලින් ආරම්භක ශේෂය වැඩිවීමට හේතු වී තිබුණි. | සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර ගිණුම් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. | CIGAS වැඩසටහනේ ආරම්භක ශේෂ ඇතුළත් කිරීමට ලබාදී ඇති උපදෙස් අනුව මෙලෙස සිදුවන්නක් බව පෙන්වා දෙමි. එය නිවැරදි කිරීම සඳහා CIGAS වැඩසටහනේ ප්‍රවර්ථන වර්ෂයේ ආරම්භක ශේෂ සටහන් කිරීම සඳහා වෙනම තිරුවක් ඇතුළත් කිරිම මගින් සිදුකළ යුතු අතර, එය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් CIGAS වැඩසටහන යාවත්කාලීන කිරීමෙන් සිදුකළ යුතු බව කාරුණිකව පෙන්වා දෙමි. |
| (ඇ) | අංක 2102 හා 2103 දරන මූලධන වැය විෂයයන් යටතේ වැයකර 2019 වර්ෂය තුළදී මිලදීගත් ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මූල්‍ය නොවන වත්කම්වල එකතු වටිනාකම රු.53,395,032 ක් වුවත්, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට (ACA-6) සටහන් කර තිබුණේ රු.28,936,839 ක් පමණකි. මේ අනුව 2019 වර්ෂය තුළ මිලදීගත් වටිනාකම රු.24,458,193 ක්වූ මූල්‍ය නොවන වත්කම්, මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට වෙන් කළ මූලධන ප්‍රතිපාදනවලින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට මිලදී ගත් ගෘහභාණ්ඩ විධිමත් අධිකාර බලයක් මත නීත්‍යානුකූලව අමාත්‍යාංශයට පැවරීම හෝ සුදුසු කටයුතු කර මූල්‍ය නොවන වත්කම් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් ගිණුම්ගත කිරීම නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | 2019 වර්ෂයට අදාළව, වැය විෂය 2102 යටතේ මිලදී ගැනීම් රු.42,946,705 ක් සහ 2103 වැය විෂය යටතේ මිලදී ගැනීම් රු.10,448,327 කි. ඒ අනුව අදාළ මුළු වටිනාකම වන රු.53,395,032 ක මුදල තුළ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා ලබාදෙන ලද රු.200,000,000 ක ප්‍රතිපාදනය උපයෝගී කරගෙන අමාත්‍යාංශය විසින් මිලදී ගනු ලැබු ගෘහ භාණ්ඩවල වටිනාකම වූ රු.24,258,193 ක වෙනස බව පෙන්වා දෙමි. එකී වත්කම් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශනවලට ආරම්භක ශේෂ ලෙස ගිණුම්වලට ගත යුතු බව කාරුණිකව පෙන්වා දෙමි. |

| | | |
|---|---|---|
| (ඇ) භාණ්ඩාගාර පොත් (SA32) අනුව **2019** වර්ෂය තුළ මිලදීගත් ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ එකතු වටිනාකම ලෙස ගිණුම්ගත කර තිබුණේ රු.**18,745,033** ක් පමණකි. මූල්‍ය නොවන වත්කම්වල දෙපාර්තමේන්තු ගිණුම් ශේෂ වටිනාකම වූ රු.**53,395,032** සහ භාණ්ඩාගාර ගිණුම් ශේෂ අතර පැවති රු.**34,649,999** ක් වූ වෙනස්කම් සසඳා නිරවුල් කිරීමටද කටයුතු කර නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම් වටිනාකම දෙපාර්තමේන්තු ගිණුම් ශේෂ හා භාණ්ඩාගාර ගිණුම් ශේෂ අතර වූ වෙනස සසඳා නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | **2019** භාණ්ඩාගාර ගිණුම් වාර්තාව (SA 82) අනුව වර්ෂය තුළ මිලදීගත් ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ එකතු වටිනාකම ලෙස ගිණුම්ගත කර තිබුණේ රු.**18,745,033** ක් බව පිළිගනිමි. එකී වෙනසට හේතුව ද **2019** මූල්‍ය ප්‍රකාශන වාර්තාවේ පිටු අංක **121** හි පෙන්වා ඇති අතර, ඉහත (අ) ඡේදය යටතේ එකී වෙනසට හේතුව පැහැදිලි කර ඇත. |

## 1.6.2 තැන්පතු ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| තැන්පත් ගිණුම් පිළිබද ප්‍රකාශයේ (**ACA-4**) අංක **6003/0/0/001/0/000/0** දරන පොදු තැන්පත් පැරණි ගිණුමේ **2019** දෙසැම්බර් **31** දිනට රු.**10,000,000** ක් වූ හර ශේෂය සඳහා වර්ෂ **05** කට වැඩි කාලයක් ඉකුත්වී තිබුණ ද, අංක **269/2019** දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ **3.7** ඡේදයේ විධිවිධාන ප්‍රකාරව පියවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. මාරු පත්‍රයකින් ඇති වූ වරද සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා පත්කළ කමිටුව විසින් මෙම ශේෂය කපා හැරීමට නිර්දේශ කර ඇතිබව තැන්පත් ගිණුම් පිළිබද ප්‍රකාශයේ දැක්වුවද එම ශේෂය නිරවුල් කිරීම වෙනුවෙන් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | අංක **269/2019** දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ **3.7** ඡේදයේ විධිවිධාන ප්‍රකාරව පියවා නිරවුල් කළ යුතු අතර නිරවුල් කිරීම වෙනුවෙන් ප්‍රමාණවත් හා කඩිනම් පියවර ගත යුතු වීම. | රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ පරිදි පත්කළ කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත හා මුදල් අමාත්‍යාංශය වෙත අංක DIST.CMB/ACC/08/Deposit හා **2018** දෙසැම්බර් **31** හා **2019** මැයි **17** දින ලිපි මගින් දන්වා ඇත. දිස්ත්‍රික් කාර්යාලීය මට්ටමින් ගත යුතු සියලු ක්‍රියාමාර්ග ගෙන ප්‍රමාණවත්ව කටයුතු කර ඇත. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකිවන පරිදි බැරකම් ලේඛන යාවත්කාලීන කර විධිමත්ව පවත්වා ගෙන යා යුතු වීම. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හි පවත්වාගෙන යනු ලබන අතර, යාවත්කාලීන කිරීමේ යම් අඩුපාඩුවක් පවතී නම් ඒවා නිවැරදි කිරීමට අදාළ නිලධාරින්ට උපදෙස් දී කටයුතු කර ඇත. |
| (ආ) | මුදල් රෙගුලාසි 420 ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම අත්තිකාරම් ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 420 ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම අත්තිකාරම් ලේඛනය විධිමත්ව පවත්වා ගෙන යාම. | - එම - |
| (ඇ) | මුදල් රෙගුලාසි 451(1) ප්‍රකාරව විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 451(1) ප්‍රකාරව විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යා යුතු වීම. | - එම - |
| (ඇ) | මුදල් රෙගුලාසි 452(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 452 (2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගෙන යා යුතු වීම. | - එම - |
| (ඉ) | මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව පුද්ගල පඩිනඩි ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව අංක 17 දරන භාණ්ඩාගාර හා විගණන ආකෘතිය පරිදි පුද්ගල පඩිනඩි ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු වීම. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු වීම. | - එම - |
| (උ) | මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාරව වාහන ලොග් පොත් යාවත්කාලිනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව පොදු 267 ආකෘතිය ප්‍රකාරව වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු වීම. | - එම - |
| (ඌ) | මුදල් රෙගුලාසි 1647(ඇ) ප්‍රකාරව ඉන්ධන ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉන්ධන ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු වීම. | - එම - |
| (එ) | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා ගෙන යා යුතු වීම. | - එම - |

### 1.6.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය. එසේම, එම | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ජාතික විගණන පනතේ 38 වන වගන්ති ප්‍රකාරව, මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම් සමුළු, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සහ මාණ්ඩලික නිලධාරී රැස්වීම්වලදී නිරතුරුව සාකච්ඡාවට භාජනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව කාරුණිකව සඳහන් කරමි. මේ සම්බන්ධ සමාලෝචන වාර්තා සකස් කර විගණකාධිපති |

| | | |
|---|---|---|
| සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | | වෙත එවීමට අභ්‍යන්තර විගණක වෙත උපදෙස් ලබාදීමට කටයුතු කරමි. |

**2.** මූල්‍ය සමාලෝචනය
-------------------------

**2.1** අග්‍රිම කළමනාකරණය
---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාසික අග්‍රිම ඉල්ලුම් කිරිම හා ලැබුණු අග්‍රිමය පිළිබඳ විශ්ලේෂණයේදී වර්ෂය තුළ ඉල්ලුම් කළ මුළු අග්‍රිමයට වඩා රු.17,891,180,832 ක් අඩුවෙන් ලැබී තිබුණු අතර, මාසිකව භාණ්ඩාගාරයෙන් ඉල්ලුම්කල අග්‍රිමයන්ට සාපේක්ෂව නොලැබුණු අග්‍රිමයන්හි ප්‍රතිශතය සියයට 31 සිට සියයට 89 දක්වා පරාසයක පැවතිණි. | අග්‍රිම ඉල්ලීම් නිසි පරිදි සැලසුම් කර ප්‍රමාණවත් ලෙස අග්‍රිම මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඔබගේ නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. |
| (ආ) | පාර්ලිමේන්තුව විසින් සලසා දී තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණු අවස්ථාවන් පැවති බව නිරීක්ෂණය විය. | ප්‍රමාණවත් ලෙස අග්‍රිම ලබාගෙන වෙන්කර තිබුණු ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කළ යුතු වීම. | 2019 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශය විසින් රජයේ මූල්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ගනු ලැබු වෙනස්කම් හේතුවෙන් මෙලෙස උපයෝජනය කිරීමේ අපහසුතා ඇතිවු බව පෙන්වා දෙමි. |

**2.2** **වියදම් කළමනාකරණය**

**----------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය<br>--------------------- | නිර්දේශය<br>---------------- | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම<br>------------------------- |
|---|---|---|---|
| (අ) | අංක **2003**, **2102** සහ **2104** දරන මූලධන වැය විෂයයන් **03** වෙනුවෙන් සලසා ගෙන තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය එකතුව රු.මිලියන **1,467.70** ක් වූ අතර ශුද්ධ වියදම එකතුව රු.මිලියන **693.89** ක් විය. මේ අනුව ප්‍රතිපාදන ඉතිරිවීම්වල එකතුව රු.මිලියන **773.81** ක් වූ අතර ඉතිරිවීම්වල ප්‍රතිශතය වැය විෂයයන් අනුව පිළිවෙලින් සියයට **41** ක් , සියයට **81** ක් හා සියයට **47** ක් වශයෙන් විය. එමෙන්ම, **2019** ජූනි **17** දිනැති අංක **04/2019** සහ **2019** සැප්තැම්බර් **24** දිනැති අංක **5/2019** දරන ජාතික අයවැය චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වියදම් කළමනාකරණය තුලින් වැය විෂයයන්ගේ ඉතිරිකිරීම් කළ බව වියදම් ප්‍රකාශයේ (ACA.2(II)) ඉතිරිවීම් සඳහා හේතු වශයෙන් දක්වා තිබුණි. නමුත් ඉහත චක්‍රලේඛ විධිවිධාන මගින් ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් අනිවාර්ය ඉතිරි කිරීම් කළයුතු වන්නේ වෙන්කල ප්‍රතිපාදනයෙන් සියයට **25** ක ප්‍රමාණයක් පමණි. | මුදල් රෙගුලාසි **50**හි විධිවිධාන ප්‍රකාරව තාත්විකව හා නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට හා වෙන් කරගත් ප්‍රතිපාදනයන් උපයෝජනය කර ඉදිකිරීම් ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට කඩිනම් පියවර ගත යුතු වීම. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය **2019** දෙසැම්බර් **31** දිනට අවසන් කිරීමට සහ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉදිකිරීම් නැවත පිරිනමා අවසන් කිරීමට උපදේශන ආයතනවල දැනුම්දීම් සැලකිල්ලට ගෙන **2019** වර්ෂයට ප්‍රතිපාදන සලසා ගත්තද, එකී ඉදිකිරීම් නියමිත පරිදි සිදුනොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි වූ බව **2019** මූල්‍ය ප්‍රකාශනවල ACA 02 (ii) යටතේ පෙන්වා දී ඇත. |
| (ආ) | මූලධන වියදම් යටතේ වූ ගොඩනැගිලි ඉදිකිරීම් **(2001)**, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ **(2002)** වැඩිදියුණු කිරීම් සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ **(2103)** මිලදී ගැනීම් වැය විෂයයන් සඳහා සලසා ගෙන තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය පිළිවෙලින් රු.**6,000,000** ක්, රු.**3,500,000** ක් හා රු.**12,000,000** ක් වූ අතර ශුද්ධ වියදම පිළිවෙලින් රු.**5,711,872** ක්, රු.**3,491,170**ක් හා රු.**10,448,327**ක් විය. මේ අනුව ඉතිරිය පිළිවෙලින් රු.**288,128**ක්, රු.**8,830**ක් | වෙන් කළ ප්‍රතිපාදනවලින් චක්‍රලේඛ විධිවිධාන පරිදි අනිවාර්ය ඉතිරි කිරීම් කර මූලධන වියදම් කළමනාකරණයට කටයුතු කළ යුතු වීම. | අදාළ ජාතික අයවැය චක්‍රලේඛ **04/2019** සහ **05/2019** විධිවිධාන ප්‍රකාරව සඳහන්ව ඇත්තේ පුනරාවර්තන වියදම් කළමනාකරණය කර ගනිමින් සමස්ත මූලධන වියදමින් **25%** ප්‍රමාණයක් ඉතිරිකිරීම් කළ යුතු බව නිසා, ඒ අනුව කටයුතු කර ඇති බව කාරුණිකව සඳහන් කරමි. |

| | | | |
|---|---|---|---|
| | හා රු.1,551,673ක් එනම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 4.8ක්, සියයට 0.25ක් හා සියයට 12.93 ක් වූයෙන් අංක 04/2019 හා 5/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛ විධිවිධාන පරිදි ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කල ප්‍රතිපාදනයෙන් සියයට 25 ක ඉතිරි කිරීම් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | | |
| (ඇ) | වැය විෂයයන් 18 ක් සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාර මාරු කිරීම් මගින් රු.216,825,000 ක ප්‍රතිපාදන එකතු කිරීම් සහ අඩු කිරීම් සිදු කර තිබුණු අතර වැය විෂයයන් 03 ක් සඳහා රු.25,375,000 ක පරිපූරක ඇස්තමේන්තු මගින් අතිරේක ප්‍රතිපාදන සලසාගෙන මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදන සංශෝධනය කර තිබුණි. ඒ හේතුවෙන් 2019 වර්ෂයේ මූලික ඇස්තමේන්තු පිළියෙල කිරීමෙහිලා සැලසුම් සහගතව, නිරවද්‍ය ලෙස සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන අනුව හැකිතාක් දුරට නිවැරදිව හා සැලසුම්සහගතව වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. | වර්තමානයේ අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී අප වෙත වෙන් කරදෙනු ලබන පුනරාවර්ථන හා මූලධන වියදම් සඳහා ලබාදෙනු ලබන සීලින් (Ceilng) තුළ කටයුතු කිරීමට සිදුවීමත් ඉල්ලුම් කරනු ලබන වැය විෂයන්ට අනුව ප්‍රතිපාදන නොලැබීමත් හේතුවෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කර ගැනීමත්, අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමත් සිදුකර ඇති බව කාරුණිකව සඳහන් කරමි. |
| (ඈ) | වැය විෂයය අංක 2104 - ගොඩනැගිලි සහ ඉදිකිරීම් යටතේ කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය ඉදිකිරීම සඳහා රු.මිලියන 1,250 ක් සහ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 188 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. එම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 200ක් මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මගින් අඩුකර ගෙන තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම්වල ගෙවීම් සඳහා ඉදිරිපත් කර තිබුණු මුළු බිල්පත් වටිනාකම රු.මිලියන 698.86 ක් (ගෙවීම් රු.මිලියන 648.75 හා බැරකම් රු.මිලියන 50.11) ක් විය. හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් 2017 වර්ෂයේ දී අතරමග අත්හිටුවා මේ දක්වාම ආරම්භ කිරීමට කිසිදු සූදානමක් | ඉදිකිරීම් කොන්ත්‍රාත්තු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී වැය කළ යුතු වන මූලධන වියදම්වලට ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගැනීම වෙනුවෙන් මුදල් රෙගුලාසි 50 හි විධිවිධාන ප්‍රකාරව තාත්වික වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම හා වෙන්කරගත් මූලධන ප්‍රතිපාදන වෙනත් වැය ශීර්ෂයක මූලධන වියදම් දැරීම සඳහා අවිධිමත් ලෙස | හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉදිකිරීම් සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව නැවත කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළද, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොලැබීම නිසා එකී ඉදිකිරීම් ආරම්භ නොවීම මත ප්‍රතිපාදන ඉතිරි විය.<br><br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තෙවන අදියරේ වැඩ අවසන් කිරීමට අදාළ උපදේශන ආයතනයේ නිර්දේශ පරිදි බිල්පත් ඉදිරිපත් වීම අනුව ගෙවීම් සිදුකර ඇති බැවින් ප්‍රතිපාදන ඉතිරිවීමක් සිදුවිය.<br>එමෙන්ම, 2102 කාර්යාල උපකරණ වැය විෂය සඳහා අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ දැනුම්දීම අනුව ස්වදේශ කටයුතු |

| | | | |
|---|---|---|---|
| | නොතිබීම හේතුවෙන් ඒ සඳහා වියදම් පැන නැගී නොතිබුණි. මේ අනුව රු.මිලියන 739.14 ක ප්‍රතිපාදන අධි ඇස්තමේන්තු කිරීමක් සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය. | ප්‍රතිපාදන ලබාදීමට කටයුතු නොකිරීමට වග බලා ගත යුතු වීම. | අමාත්‍යාංශයට කාර්යාල උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් මුදල් රෙගුලාසි 66 අනුව ප්‍රතිපාදන මාරු කර, ප්‍රතිපාදන සලසා දෙන ලද අතර, එකී රු.200,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.24,458,193 ක් පමණක් වියදම් දරා තිබීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |
| (ඉ) | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් යටතේ ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ වැය විෂයය (2102) සඳහා අයවැය ඇස්තමේන්තු මගින් රු.මිලියන 26ක් හා අතිරේකව මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මගින් රු. මිලියන 200 ක් ද ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. මෙම මාරු කිරීම් කර තිබුණේ වැය ශීර්ෂ අංක 155 ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සඳහා ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා බව නිරීක්ෂණය විය. එසේ එක් ශීර්ෂයක් යටතේ වෙන්කරගත් ප්‍රතිපාදන වෙනත් ශීර්ෂයක කාර්යයක් සඳහා උපයෝජනය කිරීම සඳහා නෛතික ප්‍රතිපාදන සැළසී ඇති බවක් නිරීක්ෂණය නොවීය. එම ප්‍රතිපාදන යටතේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් රු. මිලියන 24.46 ක් වූ ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ 2019 වර්ෂය තුල මිලදී ගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශීර්ෂ අංක 255 යටතේ අනෙකුත් අමාත්‍යාංශ විසින් දැරූ වියදම් යටතේ ගිණුමගත කර තිබුණි. මේ අනුව ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් වෙන්කර ගත් රු. මිලියන 200 ක් වූ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 175.51 ක් එනම් සියයට 87.78 ක ඉතිරිවීම් වාර්තා වී තිබුණු අතර ඒ සඳහා හේතු පැහැදිළි කර නොතිබුණි. | පවතිව නෛතික විධිවිධාන සැලකිල්ලට ගෙන ප්‍රතිපාදන සළසා ගැනීම සහ ඒවා උපරිම ලෙස උපයෝජනය කළ යුතු වීම. | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය තුළ, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ස්ථාපිත කිරීමේදී අමාත්‍යාංශයට අවශ්‍ය ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා කරන ලද ඉල්ලීමකට අනුව අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් උපදෙස් ලබාදී තිබුණේ අදාළ වියදම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් වෙන් කරන ලද මුදලින් කළමනාකරණය කර ගන්නා ලෙසයි. ඒ අනුව, ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වන ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ හා මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත විගණන විමසුමේ සඳහන් ආකාරයට මු.රෙ. 66 මාරු කිරීම් මගින් රු.200,000,000 ක් 225-1-1-0-2102 වැය විෂයට මාරු කර, අදාළ ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනිමට ප්‍රතිපාදන සලසා දුන් බව කාරුණිකව සඳහන් කරමි. එම වත්කම් ස්වදේශ කටයුතු අමාත්‍යාංශ වත්කම් ලෙස ගිණුම්වලට ගනු ලබන බවත් කාරුණිකව පෙන්වා දෙමි. මේ සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් විමසා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**2.3** බැරකම් හා බැදීම්වලට එළඹීම

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අංක 1002, 1101 හා 1202 දරන පුනරාවර්තන වැය විෂයයන් 03 සඳහා ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.569,357 ක බැරකම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි 94 හි විධිවිධාන ප්‍රකාරව වැය විෂයන්වල වාර්ෂික ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීමට කටයුතු නොකළ යුතු වීම. | තවදුරටත් පරීක්ෂා කර බලා වාර්තා කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | 2019 දෙසැම්බර් 23 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල සටහන (III) හි දැක්වෙන බැදීම් හා බැරකම් ප්‍රකාශයේ බැරකම් ශේෂය භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් විෂයයන්ට අදාළව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශයේ (SA-92) බැරකම් ශේෂය සමග සැසදී තිබිය යුතු විය. නමුත් වැය විෂයයන් 02 කට අදාලව රු.217,908 ක් වැඩියෙන්ද, වැය විෂයයන් 04 කට අදාලව රු.70,848,764 ක් අඩුවෙන්ද බැදීම් හා බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදාළ බැරකම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්විය යුතු වීම. | තවදුරටත් පරීක්ෂා කර බලා වාර්තා කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

| | | |
|---|---|---|
| (ඇ) වියදම් විෂයයන් 05 කට අදාළව 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.234,903 ක් වූ බැරකම් 2019 වර්ෂය තුළදීත් ගෙවා නිදහස් කර නොතිබුණු අතර එම බැරකම් මූල්‍ය ප්‍රකාශනවල සටහන (III) හි දැක්වෙන බැදීම් හා බැරකම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | අදාළ බැරකම් ගෙවා නිදහස් කළ යුතු අතර ගෙවා නොමැති නම් එම බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. | එකඟ වෙමි. මෙලෙස සිදුවී ඇත්තේ CIGAS වැඩසටහන සිදුකරනු ලබන නිලධාරීන් මාරු වීමත්, නවක නිලධාරීන් CIGAS වැඩසටහන සිදුකිරීමත් නිසා එකී බැරකම් යටතේ ගෙවීම් නොකර අලුතින් බැදීම් හා බැරකම් ඇතුළත් කරමින් CIGAS වැඩසටහනින් ගෙවීම් කිරීමයි. නමුත් මේ වනවිට එකී බැරකම් නොමැති බැවින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත දන්වා එම බැරකම් ඉවත් කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**2.4** වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ජනාධිපති ලේකම් කාර්යාලය (වැය ශීර්ෂය 001) විසින් සලසා දී තිබුණු ප්‍රතිපාදනයන්හි එකතුව රු.11,083,858 ක් වූ අතර ඉන් උපයෝජනය කර තිබුණේ රු.2,061,683 ක් එනම් සියයට 18.6 ක් පමණකි. එම එක් එක් වැඩසටහනක් සඳහා උපයෝජනය, සලසා දී තිබුණු ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 35 ක් සියයට 5ක් හා සියයට 00 ක් විය. | කලට වෙලාවට අක්මුදල් ලබාගෙන වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ලබාදුන් ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. | අදාළ වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබුණද, ඒ සඳහා අක්මුදල් නොලැබීම නිසා 2019 දෙසැම්බර් 31 දිනට රු.26,160,000 ක පමණ අතැති බිල්පත් ඇති බව සඳහන් කරමි. එම නිසා ප්‍රතිපාදන ඌන උපයෝජනයක් සිදුව ඇති බව පෙන්වා දෙමි. |

**2.5** අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(5) විධිවිධාන පරිදි නිකුත් කරන ලද තත්කාර්ය අතුරු අග්‍රිමවලට අදාළ කාර්යයන් ඉටුකළ වහාම පියවීම් කළයුතු වූවත් ඊට පටහැනිව අවස්ථා 28 කදී නිලධාරීන් 15 දෙනෙකුට ගෙවා තිබුණු | ලබාගත් අතුරු අග්‍රිම කාර්ය නිම කළ වහාම අප්‍රමාදව පියවීමට කටයුතු කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් සියළුම මාණ්ඩලික නිලධාරීන් දැනුවත් කර ඇති බව කාරුණිකව සඳහන් කරමි. |

රු. **1,608,244**ක් වූ තත්කාර්ය අග්‍රිම අත්තිකාරම් පියවීම දින **11** සිට දින **58** දක්වා කාල පරාසයක් ප්‍රමාද කර තිබුණි.

## 2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගෙවීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවා ස්ථාන මාරුවීම්, මියයාම, විශ්‍රාම යාම, වැඩතහනම් කිරිම සහ සේවය හැරයාම යනාදී හේතූන් මත දැනට සේවයේ නොමැති නිලධාරීන් හා සේවකයන්ගෙන් අයකර ගතයුතු හිඟහිටි ණය ශේෂ එකතුව වූ රු.1,619,556 ක් වර්ෂ 2ක් හා ඊට වැඩි කාලයක සිට අය නොවී පැවතුණි. | අදාළ නිලධාරින්ගෙන් හිඟහිටි ණය ශේෂය අයකර ගැනිමට කඩිනමින් පියවර ගත යුතු වීම. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ හිඟහිටි ණය ශේෂය 2019 දෙසැම්බර් 31 දිනට රු.2,885,696.38 වුවත්, 2020 ජූනි 26 දිනට ශේෂය රු.2,340,741.51 කි. ඒ සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය මට්ටමින් ගත හැකි සෑම පියවරක්ම ගනිමින් කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි.<br>වසර 10 සේවා කාලය සම්පූර්ණ වූ රාජ්‍ය සේවකයින්ට ඇප රහිතව ආපදා ණය දීමේ රජයේ ප්‍රතිපත්තිමය තීරණ අනුව, ණය ලබාගත් රාජ්‍ය සේවකයන් සේවය හැරයාම, සේවය අත්හිටුවීම, වැඩ තහනම් වීම වැනි කරුණු මත ණය අය කරගැනීම අපහසුවිම අපගේ පාලනයෙන් තොරව සිදුවන්නකි. ඒ අනුව, 2020 ජූනි 26 දිනට රු.544,954.87 ක් අය කරගෙන ඇති බවත් පෙන්වා දෙන අතර. අයකර ගැනීමට නොහැකි ණය ශේෂ අය කරගැනීම සඳහා නීතිපති මගින් ද කටයුතු කරමින් අය කර ගැනීමට සෑම උත්සහයක්ම ගන්නා බව කාරුණිකව සඳහන් කරමි. |

**2.7** තැන්පත් ශේෂයන්

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 06 ක අංක **6000-0-0-16-0-26** දරන අත රුදවුම් හා අංක **6000-0-0-13-0-46** දරන තෙවන පාර්ශවයන් වෙත ගෙවීම් යනාදී තැන්පතු ගිණුම් **02** හි වර්ෂ **02** සිට වර්ෂ **05** දක්වා කාලයක් කල්ගත වූ තැන්පතු වටිනාකම රු.**3,149,835** ක් වූ අතර එම තැන්පතු ගිණුම් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි **571** හි විධිවිධාන ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි **571** හි විධිවිධාන ප්‍රකාරව තැන්පත් ගිණුමෙහි වූ අතරුදවුම් හා තෙවන පාර්ශවයන් වෙත කළ යුතු ගෙවීම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | මු.රෙ.**571** විධිවිධාන ප්‍රකාරව නිරවුල් කරන ලෙස සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | අංක **6000-0-0-17-0-6** දරන වන්දි ගෙවීම් තැන්පතු ගිණුමේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල **08** කට අදාළව වර්ෂ **05** ක් හෝ ඊට වැඩි කාලයක් කල් ඉකුත් වූ තැන්පතු වටිනාකම රු.**97,212,669** ක් වූ අතර ඉඩම් වන්දි ගෙවා එම තැන්පතු ශේෂ නිරවුල් කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉඩම් වන්දි ගෙවා එම තැන්පතු ශේෂ නිරවුල් කිරීමට ප්‍රමාණවත් හා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වීම. | අක්මුදල් ලද වහාම, කල් ඉකුත් වු තැන්පතු සඳහා ගෙවීම් කරන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කරන ලදී. |

**3.** මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

**3.1** සැලසුම් කිරීම

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **2014** පෙබරවාරි **17** දිනැති අංක **01/2014** දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ **03** ඡේදයේ දැක්වෙන | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විධිමත් ලෙස වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර, එය පාලන | ඉදිරි වර්ෂයේදී චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කිරීමට |

| | | |
|---|---|---|
| විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රධානීන් විසින් තම ආයතනය වෙනුවෙන් අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා තුන් අවුරුදු මධ්‍යකාලීන අයවැය රාමුව තුළ මුදල් වර්ෂයට අදාළ අන්තර්ගත විය යුතු සියළු කරුණු හා අවශ්‍යතාවයන් ඇතුළත් කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු විය. එහෙත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සේවයේ සිටින කාර්යය මණ්ඩලය, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, ක්‍රියාකාරකම් සැලැස්මේ ක්‍රියාත්මක රාමුව හා අපේක්ෂිත නිමවුම සහ වාර්ෂික අක්මුදල් අවශ්‍යතා යනාදී කරුණු ඇතුළත් වන අයුරින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | කාරකයක් ලෙස යොදාගෙන අරමුණු සාක්ෂාත් කර ගැනිම වෙනුවෙන් වූ කාර්යභාරය ඉටු කිරිමට පියවර ගත යුතු වීම. | පියවර ගන්නා බව දැනුම් දී තිබුණි. |

## 3.2 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිර්මාණශීලිව හා නම්‍යශීලිව පවත්නා සම්පත් කළමනාකරණය තුළින් ජන ජීවිතය සවිබල ගැන්වීමේ මෙහෙවර උදෙසා කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් වූ කාර්යභාරයන් ඉටු කිරීමේදී ප්‍රමාණවත් හා කාර්යක්ෂම කළමනාකරණයකින් යුක්තව ක්‍රියාත්මක කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම හා මෙහෙවර අනුව නිර්මාණශීලිව හා නම්‍යශීලිව පවත්නා සම්පත් මනා කළමනාකරණය තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය ඵලදායී ලෙස නංවාලීම හා ජන ජීවිතය සවිබල ගැන්වීමේ දිසාවට මෙහෙයවීමට අරමුණු සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් වූ කාර්යයන් ඉටු කළ යුතු වීම. | මේ පිළිබඳව අදහස් ඉදිරිපත් කර නොතිබුණි. |

**3.3** වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 128 හා 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු ජනවාරි 15 දිනට සම්පූර්ණ කළ යුතු විය. එහෙත්, භාණ්ඩ සමීක්ෂණ කටයුතු සම්පූර්ණ කර භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර තිබුණේ 2020 ජූනි 20 දිනදීය. සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ නිර්දේශ කර තිබුණු ඌනතා වත්කම් අයිතම 59 ක්, අතිරික්තතා වත්කම් අයිතම 50 ක් සහ අපහරණය කළ යුතු වත්කම් අයිතම 54 ක් සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාළ මුදල් රෙගුලාසි හා මුදල් චක්‍රලේඛ විධිවිධාන පරිදි නොපමාව හා නිසි කලට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා පවත්වා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශයන් ක්‍රියාත්මක කර ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කඩිනම් පියවර ගත යුතු වීම. | ඉදිරියේදී අදාළ රෙගුලාසි පරිදි කටයුතු කරන බව දැනුම් දී තිබුණි. |

**3.4** රජයේ නිලධාරින් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 හා කොළඹ දිස්ත්‍රික් ලේකම්ගේ 2008 අගෝස්තු 30 දිනැති අංක AE/K/ඇප/2008 දරන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කැස්බෑව, රත්මලාන හා පාදුක්ක ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ඇප ලබාගත යුතු නිලධාරීන් 09 දෙනෙකුගෙන් ඇප ලබාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 හා 2008 අගෝස්තු 30 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ කටයුතු සිදුකිරීමට සටහන් කරගත් බව දක්වා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහරගම හා කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දැනට සේවයේ නියුක්ත නොවන නිලධාරීන් පිළිවෙලින් 08 දෙනෙකු හා 06 දෙනෙකුගේ තැන්පතු පාස්පොත් ආපසු භාරදීමට කටයුතු කර නොතිබුණි. | සේවයේ නියුක්ත නොවන නිලධාරීන්ගේ පාස්පොත් ආපසු භාරදීමට කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බවට දන්වා තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ මුදල් රෙගුලාසි 892 හි විධිවිධාන ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන්ගේ සංශෝධිත වාර්තාවන් සෑම වර්ෂ 03 ක් අවසානයේදි අදාළ අමාත්‍යාංශ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල එම විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 892 හි විධිවිධාන ප්‍රකාරව අදාළ වාර්තා අමාත්‍යාංශ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වීම. | ඉදිරියේදී කටයුතු කරන බව දන්වා තිබුණි. |

**3.5** මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | --------------- | ------------------------ |
| (අ) | මහරගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල 2014 දෙසැම්බර් 09 දින මිය ගිය ආධාරලාභිනියකගේ වැඩිහිටි දීමනා කාඩ්පත උපයෝගී කරගෙන 2018 මැයි මස දක්වා මාස 42කදී රු.84,000 ක වැඩිහිටි ජීවනාධාර මුදලක් අවිධිමත් ලෙස ලබාගෙන තිබුණි. මෙම මුදල් ආපසු අයකර ගැනීම හා වගකිව යුතු නිලධාරීන්ට සම්බන්ධ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් වංචාවන්ට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හා ආයතනයට සිදුවූ මූල්‍ය පාඩුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 101 හා 156 රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ගෙන් පූර්ණය කර ගැනීමට කටයුතු කිරීම කඩිනම් කළ යුතු වීම. | ඉදිරියේදී අදාළ පරීක්ෂණ සිදුකර මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහරගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 525 A උඩහමුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරි වසම තුළ මිය ගිය වැඩිහිටියන් පස්දෙනෙකුගේ රු.392,000ක වැඩිහිටි ජීවනාධාර මුදලක් අවිධිමත් ලෙස ලබාගෙන තිබීම සම්බන්ධයෙන් ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් එම මුදල අයකර ගැනීමට හා වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හා ආයතනයට සිදුවූ මූල්‍ය පාඩුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 101 හා 156 රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ගෙන් පූර්ණය කර ගැනීමට කටයුතු කිරීම කඩිනම් කළ යුතු වීම. | |
| (ඇ) | ගණනය කිරීමේ හා පරිවර්තනය කිරීමේ දෝෂ, විශ්‍රාම වැටුප් දෙවරක් ගෙවීම, විශ්‍රාමිකයන් මියගිය පසු ඒ බව තහවුරු කරගැනීමෙන් තොරව තවදුරටත් විශ්‍රාම වැටුප් ගෙවීම, හමුදා විශ්‍රාම වැටුප් සඳහා දෙවරක් ජීවන වියදම් දීමනා ගෙවීම යනාදි හේතූන් මත කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ට අදාළ බලප්‍රදේශයන්හි විශ්‍රාමිකයන්ට අවිධිමත් හා අක්‍රමිකතා සහිතව විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. ඉකුත් කාලපරිච්ඡේදවලදී විශ්‍රාමිකයන් 367 දෙනෙකුට වැඩිපුර ගෙවා තිබුණු විශ්‍රාම වැටුප් මුදල රු.68,308,347 ක් විය. ඉන් 2019 දෙසැම්බර් 31 දින වනවිට රු.41,969,994 ක් අය කරගෙන තිබුණද, තවදුරටත් අයකර ගත යුතු හිඟහිටි මුදල රු.26,338,380 ක් විය. එකී අයකර ගත යුතු මුදලින් වර්ෂ 5 සිට වර්ෂ 10 හා 10 ට වැඩි කාලයක් කල් ඉකුත් වූ ශේෂද පැවතුණි. | විශ්‍රාම වැටුප් නිවැරදි හා විධිමත් ලෙස සකසා ඒවා පරීක්ෂා කිරීමෙන් අනතුරුව විශ්‍රාම වැටුප් ගෙවීමටත්, විශ්‍රාමිකයන් සම්බන්ධයෙන් ජීවත්වීමේ සහතික නිරතුරුවම ලබාගනිමින් ජීවතුන් අතර සිටින විශ්‍රාමිකයන් වෙනුවෙන් පමණක් විශ්‍රාම වැටුප් ගෙවීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් කළ යුතු වීම. | ඉදිරි කාලයේදී විගණනයෙන් පෙන්වා දෙන කරුණු අනුව නිවැරදිව හා විධිමත්ව කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් දෙන ලදි. ඒ පරිදි ඉදිරියේදී කටයුතු කෙරෙන බව දන්වා ඇත. |

**3.6** පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දින වන විට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගිනි ගැනීමෙන් සිදු වූ හානියට වර්ෂ 07 කට සහ මහරගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ගිනි ගැනීමෙන් සිදු වූ හානියට වර්ෂ 04 කට අධික කාලයක් ඉකුත් වී තිබුණද, එම හානිවලින් අයකර ගැනිමට හෝ කපාහැරීමට කටයුතු කර නොතිබුණු පාඩු හා හානි වටිනාකම පිළිවෙලින් රු.92,606,688 ක් සහ රු.624,491 ක් වශයෙන් එකතුව රු.93,231,179 ක් විය. එම පාඩු හා හානි නිරවුල් කිරිම සඳහා 2020 ජූනි 30 වනවිටත් කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත නිරීක්ෂණයන්ද කරනු ලැබේ. | පාඩු හා හානි පිළිබඳව පරීක්ෂණ කඩිනමින් පවත්වා ඊට වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විධිමත් පියවර ගැනීම සහ රජයට සිදුවූ පාඩුව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 101 හා 156 රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ඊට වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් පූර්ණය කර ගැනීමට හා අනතුරු හානි නිරවුල් කිරීමට කළ යුතු වීම. | හානිය කපා හැරීම සඳහා ඉල්ලා තිබුණද, එය කපා හැරීමට නොහැකි බව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දී ඇති බව දන්වා තිබුණි. |

**3.7** කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීමට ප්‍රථම ප්‍රාදේශිය ලේකම් බල කොට්ඨාශයට ගැනෙන වසම් හා සීමාවන් නිර්ණය කොට ත්‍රෛභාෂාවෙන් ගැසට් පත්‍රයේ පළකළ යුතු වුවද, 1999 මැයි 19 දින ආරම්භ කර ඇති පාදුක්ක ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හා 1999 මාර්තු 03 දින ආරම්භ කරන ලද තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙනුවෙන් අදාළ සීමාවන් නිර්ණය කොට කොට්ඨාශ ස්ථාපිත කිරීමේ ගැසට් නිවේදන 2019 දෙසැම්බර් 31 දින වනවිටත් ප්‍රකාශයට පත්කර නොතිබුණි. | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ස්ථාපිත කිරීමට ප්‍රථම එම ලේකම් බල කොට්ඨාශවලට ගැනෙන වසම් හා සිමාවන් නිර්ණය කොට ත්‍රෛභාෂාවෙන් ගැසට් පත්‍රයේ පළ කළ යුතු වීම. | මේ සඳහා අදාළ ඉදිරි කටයුතු සිදුවෙමින් පවතනි බව දන්වා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහරගම නගර සංවර්ධනය සඳහා ඉඩම් අත්කර ගැනීම යටතේ ගමනාගමන මණ්ඩලයට අයත් ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය පවරාගෙන තිබුණි. 2016 පෙබරවාරි 02 දිනැති තක්සේරු දෙපාර්තමේන්තුවේ වන්දි මුදල් තක්සේරු වටිනාකම වන රු.මිලියන 112 ක් ගමනාගමන මණ්ඩලයට ගෙවීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | අදාළ ප්‍රතිපාදන ලබාගෙන වන්දි මුදල ගෙවීමට කටයුතු කළ යුතු වීම. | අදාළ ඉඩම විධිමත්ව පවරාගෙන ඇති නමුත් වන්දි ගෙවීම අවසන් වී නොමැති බව දන්වා තිබුණි. |
| (ඇ) | මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ස්ථාපිත කර ඇති මහල් 06 කින් යුක්ත නව ගොඩනැගිල්ල සඳහා ඉදිකළ යුතු විදුලි සෝපාන 04 2019 දෙසැම්බර් 31 දින වනවිටත් ඉදිකර නොතිබුණි. | අදාළ විදුලි සෝපාන කඩිනමින් සකස් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වීම. | අවශ්‍ය ප්‍රතිපාදන සලසාගෙන අදාළ විදුලි සෝපාන ඉදිකිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන බවට දන්වා ඇත. |
| (ඈ) | පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ වග දකුණ හා වග නැගෙනහිර ග්‍රාම නිලධාරි වසම්වලට අයත් රක්ෂිත ඉඩමක රජයේ ඉඩම් ඉතා දීර්ඝ කාලයක් තිස්සේ සංවර්ධනය කර බුක්ති විඳින හා රක්ෂිතයේ එලදා බදුකරුවන් බුක්ති විඳින ඉඩම්වල අයිතිය පිළිබඳව තොරතුරු අනාවරණය කර ගැනීමට ප්‍රමාණවත් පියවරයන් ගෙන නොතිබුණි. | එලදාබදු අයකිරීම් පදනම මත බදුදී ඇති රක්ෂිතයේ ඉඩම්වල සංවර්ධිතයන් සිදුකර නේවාසික කටයුතු සිදුකරන පාර්ශව සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගත යුතු වීම. | මේ පිළිබඳ අදාළ ඉදිරි කටයුතු සිදුවෙමින් පවතින බවට දන්වා ඇත. |
| (ඉ) | දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා බලප්‍රදේශයේ වරිපනම් අංක 175 දරන පර්චස් 26.5 ක වර්ග ප්‍රමාණයකින් යුත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඉඩම විධිමත් පරිදි රජයට පවරා ගැනීමකින් තොරව මහජන මුදල් වැයකර රත්මලාන ප්‍රාදේශිය ලේකම් කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකර තිබුණි. මෙම ගොඩනැගිල්ලේ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා දැනට ජනසතු සේවා ක්‍රිකට් සංගමය වෙත දීර්ඝකාලීනව බදු ලබාදී ඇති රත්මලාන ගාලු පාර අංක 511 හි පිහිටි ඉඩමෙන් කොටසක් (පර්.50) ලබාගැනීමට කටයුතු කරන බවට රත්මලාන ප්‍රාදේශිය ලේකම් | අදාළ ඉඩම පවරා ගැනීමට අදාළ කටයුතු කඩිනමින් කළ යුතු වීම. | මේ සම්බන්ධව ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බවට කරුණු දක්වා ඇත. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | වෙත 2017 නොවැම්බර් 17 දින දැනුම් දී තිබුණද, මෙම ඉඩම පවරා ගැනිම සම්බන්ධව ඉදිරි කටයුතු 2019 දෙසැම්බර් 31 දින වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| (ඊ) | කොළඹ, දෙහිවල, කොලොන්නාව, කැස්බෑව සහ හෝමාගම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පවත්වා ගෙන යනු ලබන ඉඩම්වල අයිතිය එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු නොවූ අතර ඒවායේ අයිතිය පවරා ගැනීම සඳහා මේ වන තෙක් විධිමත් පියවර ගෙන නොතිබුණි. අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු නොවූ මෙම ඉඩම්වල ඉදිකිරීම් කටයුතු සඳහා එම කාර්යාල විසින් රජයේ මුදල් විශාල වශයෙන් වැය කර තිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටි ඉඩම්වල අයිතිය පවරා ගැනිමට කඩිනම් පියවර ගැනීම. | ඉදිරි කාලයේදී ඉඩම්වල අයිතිය පවරාගැනීමේ කටයුතු කඩිනම් කරන බව දැනුම් දී තිබුණි. |

**4.** තිරසාර සංවර්ධනය

------------------------

**4.1** තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

---------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජූලි 17 දිනැති අංක 4/2018 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 08 ඡේදයේ විධිවිධාන පරිදි සමාලෝචිත වර්ෂයේදී වර්තමාන හා අනාගත සංවර්ධන කාර්යයන් තුල තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක අයත් විෂයය ක්ෂේත්‍ර 22 ක් යටතේ තිරසාර සංවර්ධන ඉලක්ක 53 ක් හඳුනාගෙන සැලසුම පිළියෙල කර තිබුණි. නමුත් හඳුනාගත් ඉලක්ක සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් ක්‍රියාත්මක කර හෝ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් ව්‍යාපෘති හා කාර්යභාරයන් නිශ්චය කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන් කිරීම් ඇතුළත් කර නොතිබුණි. එහෙත් තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගෙන තිබුණු බවට 2019 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය යටතේ දැක්වුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව තිරසර සංවර්ධනය උදෙසා තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් ව්‍යාපෘති සහ වැඩසටහන් නිශ්චය කර ඒ සඳහා ප්‍රතිපාදන සලසා ගැනීම වෙනුවෙන් කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

## 5. යහපාලනය

### 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය ආයතනයක් වෙතින් සේවාවන් ලබන මහජනතාවට අවශ්‍යතාවයන් කඩිනම්ව, කාර්යක්ෂමව, ගුණාත්මකව හා අඛණ්ඩව ඉටු කරන බවට ලිඛිත බැදීමක් ආකාරයෙන් සහ පොදුවේ සැමට පිළිගත හැකි තත්ත්ව හා ප්‍රමිතීන් යටතේ කිසියම් සේවාවක් උපරිම ආකාරයෙන් ඉටුකරමින් මහජනයාට සේවය සැපයිමට හැකි ආකාරයෙන් පුරවැසි ප්‍රඥාප්තියක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය හඳුන්වාදී තිබුණි. එහෙත් එම අවශ්‍යතාවය අනුව කටයුතු කළ බවක් නිරීක්ෂණය නොවීය. | මහජනතාවට අවශ්‍යතාවයන් කඩිනම්ව, කාර්යක්ෂමව, ගුණාත්මකව හා අකණ්ඩව සේවාවන් සැපයිම තුලින් මහජනතාවගේ ජීවන තත්ත්වය ඵලදායී ලෙස නංවාලීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා වූ පුරවැසි ප්‍රඥාප්තියස්ථාපිත කිරීමේ කටයුතු කඩිනම් කළ යුතු වීම. | මහජනතාවට ලබාදෙන සේවාවන් වඩාත් කාර්යක්ෂමව හා පලදායීව ලබාදීමට පුරවැසි සේවාලාභී ප්‍රඥාප්තිය වඩාත් අර්ථවත්ව ක්‍රියාත්මක කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත සේවක සංඛ්‍යාව වූ 2101 න් සියයට 13 ක් හෙවත් පුරප්පාඩු 272 ක් පැවතීම හේතුවෙන් මහජනතාවට සපයන සේවාවන්හි කාර්යක්ෂමතාවයට හා ඵලදායීතාවයට එය අහිතකර ලෙස බලපෑ හැකි බවත් නිරීක්ෂණය විය. | අදාළ අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | කාර්යාල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට දක්වා ඇතත්, නිලධාරීන් ලබා නොදීම නිසා පුරප්පාඩු පවතින බව දන්වා ඇත. |